# පුවත් සරණිය
## සංස්කෘතික කේන්ද්‍රය

පළමුවන වෙළුම - 2024
ISSN 3121-3294

රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව

අන්තර් සංසකෘතික මධ්‍යස්ථන ප්‍රතිභා 2024



විවෘත සමුහ මිශ්‍ර නර්තන තරඟ අංශය යටතේ ප්‍රථම ස්ථානය ජයග්‍රහණය කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රමාත්‍ය, හරිනි අමරසූරිය මැතිණිය අතින් 2024 දෙසැම්බර් 14 දින සම්මානයෙන් පිදුම් ලද රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ නර්ථන කණ්ඩායම.

සංස්කාරයක මණ්ඩලය
එම්.ආර්.එෆ්. රිෆ්කා
එන්.එච්.ටී. අනුරුද්ධ



## අන්තර්ගතය


සම්බන්ධීකාරකතුමාගේ ප්‍රකාශය

සංස්කෘතික කේන්ද්‍රය - හැඳින්වීම

සංස්කෘතික කේන්ද්‍රයේ නිළධාරී මණ්ඩලය හිටපු සම්බන්ධීකාරකවරුන්

සංස්කෘතික කේන්ද්‍රයේ පාඨමාලා

වැඩසටහන් හා ක්‍රියාකාරකම්

සංස්කෘතික කේන්ද්‍රයේ ජයග්‍රහණ




## සම්බන්ධීකාරකතුමාගේ ප්‍රකාශය



රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය ආරම්භ වන්නේ, 1999 නොවැම්බර් 21 දිනය. ඒ, ප්‍රකට කලාකරුවෙකු වූ සහ විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු වූ අභාවප්‍රාප්ත ආචාර්ය ධර්මසේන පතිරාජා මහතාගේ සුරතින් ය. හරවත් සංවර්ධනයක් උදෙසා සංස්කෘතික සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ව්‍යාප්තිය සඳහා දිවයින පුරා සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමට සමගාමීව එවකට රජය විසින් රට පුරා සංස්කෘතික මධ්‍යස්ථාන සංස්ථාපනය කිරීමට ගත් ප්‍රයත්නයට සමගාමීව විශ්වවිද්‍යාලයන්හි ද සංස්කෘතික කේන්ද්‍ර පිහිටුවන ලදී.

එසේ සංස්ථාපනය  වූ  රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතිය කේන්ද්‍රය ආ ගමන් මග දශක තුනකට ආසන්න වෙමින් ඇත. එම ගමන් මගේ රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථයින් මුල් කරගෙන විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සෞන්දර්යාත්මක රස වින්දනය ප්‍රවර්ධනය කර ගැනීමට මෙන්ම ඔවුන්ගේ සැඟවුණු සෞන්දර්යාත්මක විභවතා එළිපෙහෙළි කර ගැනීමට පියස්සක් වූ බව අප කේන්ද්‍රය හා බැඳුණු ස්මෘතීන් ආවර්ජනය කෙරෙනු ඇත.

සංස්කෘතික කේන්ද්‍රයේ එම අත්දැකීම් මතක ලෙස තැන්පත් කිරීමට කිරීමට සහාය වූ බොහෝ දෙනෙකුගේ මැදිහත්වීම අප විසින් අගය කළ යුතුය. පළමු සම්බන්ධීකාරක වූ විශ්‍රාමික මහාචාර්ය ජයන්ත අමරසිංහ මහතා ඇතුළු සියලු සම්බන්ධීකාරකවරුන්ගේ භූමිකාව මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතුය. එමෙන්ම සංස්කෘතික කේන්ද්‍රයේ පීඨ නියෝජිතයින් මෙන්ම උපදේශක මණ්ඩලයේ සාමාජිකයින්ද සිහිපත් කළ යුතුය.

අප විසින් එහි ඉතිහාසයේ ප්‍රථම වතාවට වාර්ෂිකව ලිපි සරණියක් (News Letter) ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ සංස්කෘතික කේන්ද්‍රයේ ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාල ප්‍රජාවට අනාවරණය කිරීමටත්, විද්‍යාර්ථීයන්ගේ නිර්මාණශීලී හැකියාවන් සහ සංස්කෘතික කේන්ද්‍රයේ ව්‍යාපෘති  සමාජගත කිරීමටත් හැකියාවක් ලැබේ යැයි අපේක්ෂා කරන බැවිණි. රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රයේ සංස්කෘතික ක්‍රියාකරම් සඳහා නිබඳ සහය ලබා දෙන රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී. ඒ. ජයන්ත මහතා සහ මානව ශුස්ත්‍ර සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති අයි. රේණුක ප්‍රියන්ත මහත්වරුන්ට ද අපගේ කෘතඥතාවය හිමිවිය යුතුය. තව ද  ලිපි සරණිය සංස්කරණය සඳහා දායකත්වය දැක්වූ එම්.ආර්.එෆ්. රිෆ්කා සහ එච්.ටී. අනුරුද්ධ මහතාට අපගේ ස්තුතිය හිමි විය යුතුය.

ආචාර්ය සුරංජිත් ගුණසේකර,
සංස්කෘතික කේන්ද්‍රය,
රුහුණ විශ්වවිද්‍යාලය,
මාතර.

## සංස්කෘතික කේන්ද්‍රය පිළිබඳ හැඳින්වීම

සංස්කෘතික කේන්ද්‍රය, රුහුණ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සෞන්දර්යාත්මක රසවින්දනය සහ විවිධ කලා කුසලතා ඔප්නැංවීම සඳහා ක්‍රියාත්මක මූලික නිල ආයතනයයි. මෙම ආයතනය බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධ වේ. එය 1999 නොවැම්බර් 21 වන දින ආරම්භ කොට ඇති අතර දැනට වසර 26 ක කාලයක් තුළ විවිධ සංස්කෘතික හා පර්යේෂණ අංශයන්හි කටයුතු සිදු කරයි. විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය, සංස්කෘතික දැනුවත්භාවය වර්ධනය කිරීම, ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සහ සිසුන් සහ පුළුල් විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සමාජ සමගිය ප්‍රවර්ධනය කිරීම සඳහා කැප වූ ආයතනයකි. එසේම, මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සංස්කෘතික ක්‍රියාකාරකම්, උරුමය සහ කලාත්මක ප්‍රකාශනය ප්‍රවර්ධනය කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, සංස්කෘතික කේන්ද්‍රය මගින් සංස්කෘතිකමය වශයෙන් විශාල කාර්යභාර්යයක් විශ්වවිද්‍යාලය කෙරෙහි ඉටු කෙරේ.

සංස්කෘතික හා කලාත්මක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්කෘතික උත්සව, ප්‍රදර්ශන සහ රංගනයන් සංවිධානය කිරීම මෙන්ම සාම්ප්‍රදායික හා සමකාලීන ශ්‍රී ලාංකික සංස්කෘතික ප්‍රකාශන සඳහා සහය වීම, සංස්කෘතික වැඩසටහන් හා තරඟාවලි සඳහා සිසුන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීම, කලාව හා සංස්කෘතිය පිළිබඳ ශිෂ්‍ය සංවර්ධනයට පහසුකම් සැලසීම යනාදී සේවාවන් සංස්කෘතික කේන්ද්‍රය මගින් සිදු කෙරේ.

### සංස්කෘතික කේන්ද්‍රයේ අරමුණු

- සමස්ත රුහුණ විද්‍යාල ප්‍රජාවෙහි රසඥතාව සහ නිර්මාණ කෞශල්‍යය ප්‍රවර්ධනය කිරීම.
- ජාතික වැදගත්කමකින් යුත් රුහුණු පුරවරයට විශේෂිත වූ සංස්කෘතිකාංග පිළිබඳ පර්යේෂණ කිරීම, සංරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම.

### සංස්කෘතික කේන්ද්‍රයේ කාර්යයන්

අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කරගනු වස් සංස්කෘතික කේන්ද්‍රය ඒකක දෙකකින් සමන්විත වනු ඇත. ඒ අනුව, **සෞන්දර්ය ඒකකය හා පර්යේෂණ ඒකකය** එහි ක්‍රියාත්මක වේ. මෙම ඒකකයන් යටතේ ක්‍රියාත්මක වැඩසටහන් පිළිබඳව පහතින් සඳහන් වේ.

1. **සෞන්දර්ය ඒකකකය මගින් සිදු කෙරෙන කාර්යයයන්**

   - චිත්‍රපට සහ වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කිරීම.
   - පුහුණු පාඨමාලා සහ ප්‍රාසාංගික දර්ශන සංවිධානය කිරීම.
   - ජන කලා සංදර්ශන පැවැත්වීම.
   - සංගීත පුහුණු පාඨමාලා සහ ප්‍රසංග පැවැත්වීම.
   - නර්තන පුහුණු පාඨමාලා සහ ප්‍රසංග පැවැත්වීම.
   - චිත්‍ර හා මූර්ති පුහුණු පාඨමාලා සහ ප්‍රදර්ශන පැවැත්වීම.
   - සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

## 2. පර්යේෂණ ඒකකය මගින් සිදු කෙරෙන කාර්යයන්

- පර්යේෂණ ව්‍යාපෘති, ඓතිහාසික ස්ථාන හා පුරාවිද්‍යාත්මක ස්මාරක ගවේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති, අන්තර් ජනවාර්ගික සංස්කෘතික අධ්‍යයන හා ජනකලා, ජනශ්‍රැති පිළිබඳ පර්යේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති සිදු කිරීම.

- ජාතික වැදගත්කමකින් යුත් රුහුණු පුරයට විශේෂිත වූ සාහිත්‍ය, කලා, ජනශ්‍රැති, මානව විද්‍යා හා සමාජවිද්‍යා යන විෂය ක්ෂේත්‍රවලට අදාළ විවිධ ව්‍යාපෘති යෝජනා සකස් කොට ක්‍රියාත්මක කිරීම මෙම ඒකකය හරහා සිදු කිරීම.

- ඓතිහාසික ස්ථාන හා පුරාවිද්‍යාත්මක ස්මාරක ගවේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති යටතේ රුහුණු ප්‍රදේශයට අයත් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්මාරක පිළිබඳ ගවේෂණ, පර්යේෂණ කිරීම සහ සංරක්ෂණ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීම සිදු කෙරෙන අතර අන්තර් වාර්ගික සංස්කෘතික අධ්‍යයන හරහා විවිධ ජන වර්ගවලට එනම්, සිංහල, දෙමළ, මුස්ලිම් සහ මැලේ යන ජනවර්ගවලට අයත් ආවේණික සංස්කෘතිකාංග හඳුනා ගැනීම, සංරක්ෂණය, හුවමාරුව සහ ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වේ.

- ජනකලා, ජනශ්‍රැති පිළිබඳ පර්යේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති යටතේ, කෝලම්, වෙස් මුහුණු, රූකඩ, ජන නැටුම්, ජන ගායනා, ජන සංගීත වැනි පාරම්පරික කලා නිර්මාණ ශිල්පී පරම්පරා, පාරම්පරික කලා තාක්ෂණය වැනි ක්ෂේත්‍ර පිළිබඳ ගවේෂණය සහ පර්යේෂණ පැවැත්වීම, පිටපත් කිරීම්, පටිගත කිරීම්, වීඩියෝ පටිගත කිරීම් වැනි ක්‍රමවලින් ජන කලා සංරක්ෂණය කිරීම, ජනශ්‍රැති අධ්‍යයනය හා සංරක්ෂණ ව්‍යාපෘති සිදු කිරීම හා ජන සාහිත්‍ය, ජන වෙදකම, ජන තාක්ෂණය, ජන සූපවේදය වැනි අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ මුද්‍රණය, පටිගත කිරීම හා සූක්ෂම ඡායාරූපගත කිරීම වැනි ක්‍රම මඟින් සංරක්ෂණය කිරීම සිදු කෙරේ.



## සංස්කෘතික කේන්ද්‍රයේ වර්තමාන කාර්ය මණ්ඩලය



ආචාර්ය ඒ. එම්.ඒ. එස්. ගුණසේකර
සම්බන්ධීකාරක
සංස්තික කේන්ද්‍රය



ප්‍රදීප් නානායක්කාර
වැඩ බලන ස්ථානභාර නිළධාරීතුමා
සංස්තික කේන්ද්‍රය



එන්. එච්. ටී. අනුරුද්ධ
සංවර්ධන නිලධාරී
සංස්කෘතික කේන්ද්‍රය



එම්.ආර්.එෆ්. රිෆ්කා
සීමාවාසික පුහුණු නිළධාරිණී
සංස්කෘතික කේන්ද්‍රය

## සංස්කෘතික කේන්ද්‍රයේ හිටපු සම්බන්ධීකාරකවරුන්



විශ්‍රාමික මහාචාර්ය ජයන්ත අමරසිංහ මහතා
සිංහල අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



හිටපු මහාචාර්ය විලේගොඩ අරියදේව හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ආචාර්ය සීවලී බණ්ඩාර මනතුංග මහතා
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශාන්තසිරි අබේවර්ණ මහතා
රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



විශ්‍රාමික මහාචාර්ය ධර්මා රාජපක්ෂ මහත්මිය
සිංහල අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ආචාර්යකය එල්. එස්. කරුණාරත්න මහත්මිය
සිංහල අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



මහාචාර්ය දේව මයිකල්ද සිල්වා මහතා
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ආචාර්ය දර්ශන මනෝජ් බණ්ඩාර මහතා
(වැඩබලන සම්බන්ධීකාරක)
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ආචාර්ය සුරංජිත් ගුණසේකර මහතා
(වර්තමාන)
සමාජවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය

## සංස්කෘතික කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන පාඨමාලා





රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය හා සංස්කෘතික අමාත්‍යාංශය ඒකාබද්ධව රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ කුසලතා වර්ධනයට හා ඔවුන්ගේ වෘත්තීයමය දිවියට අත්වැලක් වනු පිණිස පහත සඳහන් පාඨමාලා සංස්කෘතික කේන්ද්‍රයේ පවත්වන ලදී.

- උඩරට නර්ථනය
- පහතරට නර්තනය
- ඡායාරූපකරණය
- චිත්‍ර හා මූර්ති
- නාට්‍ය හා රංගකලාව

උඩරට නර්තනය පාඨමාලාව සඳහා ***දිනුක සඳරුවන්*** මහතාද, නාට්‍ය හා රංගකලාව පාඨමාලාව සඳහා ***තාරක පුෂ්පකුමාර*** මහතාද, ඡායාරූපකරණය පාඨමාලාව සඳහා ***සංජු උෂාන් රංගොඩගේ*** මහතාද, චිත්‍ර පාඨමාලාව සඳහා ***වජිර බොරලැස්ස*** මහතාද සහ සංගීතය පාඨමාලාව සඳහා ***ඩඩ්ලි එස්. ජයවර්ධන*** මහතාද සම්පත්දායකයින් ලෙස කටයුතු කරන ලදී.







### මාධ්‍ය පෙරහුරු වැඩසටහන

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය සහ people.lk සමග ප්‍රතිභා මාධ්‍ය ජාලය එක්ව රුහුණ විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ මාධ්‍ය පාඨමාලාව හැදෑරූ ශිෂ්‍යයන්ගේ මාධ්‍ය පෙරහුරු වැඩසටහන 2024 වර්ෂයේ ජනවාරි 06 වන දින පවත්වන ලදී.







## නව පාඨමාලා ආරම්භ කිරීම - 2024

රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය මඟින් විද්‍යාර්ථීන්ගේ දක්ෂතා ඔප් නැංවීම උදෙසා විවිධ වූ පාඨමාලාවන් ආරම්භ කරන ලද අතර එම පාඨමාලාවන් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයේ සියලුම විද්‍යාර්ථීන් සඳහා අවස්ථා විවෘත කරන ලදී. ඒ අනුව සංස්කෘතික කේන්ද්‍රය මඟින් චිත්‍ර, උඩරට නර්තනය, පහතරට නර්ථනය, නාට්‍ය හා රංග කලාව, සංගීතය හා ඡායාරූපකරණය යන පාඨමාලාවන් ආරම්භ කරන ලදී.



සංස්කෘතික කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන චිත්‍ර පාඨමාලාව යටතේ ව්‍යාපාර කටයුතු සඳහා චිත්‍ර ඇඳීමට විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් පුහුණු කිරීම වජිර බොරලැස්ස මහතාගේ මූලිකත්වයෙන් 2024 වර්ෂයේ ජනවාරි 10 වන දින සිදු කරන ලද අතර 2024 වර්ෂයේ ජනවාරි මස 17 වන දින සංස්කෘතික කේන්ද්‍රයේ නව නර්තන පාඨමාලාවද ආරම්භ කරන ලදී.







## සහෝදරයින්ගේ සංග්‍රාමය (Battle of Brotherhood) ක්‍රිකට් තරගය සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන් සංවිධානය කිරීම

යාපනය විශ්වවිද්‍යාලයීය හා රුහුණ විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම් අතර 2024 මාර්තු 30 වන දින රුහුණ විශ්වවිද්‍යාලයීය ක්‍රීඩාංගණයේදී පවත්වන ලද 'සහෝදරයින්ගේ සංග්‍රාමය' ක්‍රිකට් තරගයට සමගාමීව සංස්කෘතික කේන්ද්‍රය මඟින් සෞන්දයීයාත්මක අංගයන් රැසක් සංවිධානය කරන ලදී. උතුර-දකුණ සමාජ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය විය. එහිදී සිංහල හා දෙමළ සංස්කෘතීන්හි අනන්‍යතාවය පිළිබඳ දැනුවත්බව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සිංහල හා දෙමළ සාම්ප්‍රදායික නර්තන අංග ගණනාවක් ඉදිරිපත් කෙරිණි. රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති ජ්‍යෝෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන සහ යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එස්. ශ්‍රීසත්ගුණරාජා මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද මෙම ක්‍රිකට් තරගාවලිය රුහුණු විශ්වවිද්‍යාලයීය සමාජ සංහිඳියා මධ්‍යස්ථානය සහ ක්‍රීඩා අංශය මගින් සංවිධානය කරන ලද අතර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ ලයිකා ඥානම් පදනම මගින් මේ සඳහා අනුග්‍රහය දක්වන ලදී.

High Commission of India
Colombo




Lyca Gnanam
FOUNDATION

## අවුරුදු නැකැත් සීට්ටු ලබා දීම



2024 අප්‍රේල් මස 08 වන දින සංස්කෘතික කේන්ද්‍රයේ මූලිකත්වයෙන් රබීන්ද්‍රනාත් තාගෝර් ශ්‍රවනාගාරයේදී හිටපු උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන, හිටපු නියෝජ්‍ය උපකුලපති, මහාචාර්ය සමන් චන්දන සහ අධ්‍යයනාංශ ප්‍රධානීන් වෙත සිංහල-දමිළ අලුත් අවුරුදු නැකැත් සීට්ටු ප්‍රධානය කිරීමේ අවස්ථාවේ මතකයන්





## “රාමුව” සහ “සෙවනැලි” නාට්‍යයන් ප්‍රදර්ශනය කිරීම

රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය මඟින් අන්තර් සංස්කෘතික ප්‍රතිභා කෙටි නාට්‍ය තරගාවලියේ ජයග්‍රහණයන් ලබා ගන්නා ලද “රාමුව” සහ “සෙවනැලි” යන නාට්‍යයන් රුහුණ විශ්වවිද්‍යාලයීය ප්‍රජාව උදෙසා ප්‍රදර්ශනය කිරීම 2024 අගෝස්තු 07 වන දින පෙ.ව.10.00 ට රුහුණ විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ශ්‍රවනාගාරයේදී වේදිකාගත කරන ලදී. රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන සහ හිටපු නියෝජ්‍ය උපකුලපතිතුමන් වන ආචාර්ය සමන් චන්දන මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක, ආචාර්ය සුරන්ජිත් ගුණසේකර මහතාගේ මඟ පෙන්වීම යටතේ මෙම උත්සවය සංවිධනය කෙරිණි.







## උත්සහයක අස්වැන්න - පාඨමාලා අවසන් කිරීමේ සහතික පත්‍ර ප්‍රධානය

රුහුණ විශ්වවිද්‍යාලීය සංස්කෘතික කේන්ද්‍රය මගින් 2023 වර්ෂයේ පවත්වනු ලැබූ උඩරට නර්තනය, පෙරදිග සංගීතය, ජන සංගීතය, චිත්‍ර හා මූර්ති, ඡායාරූපකරණය හා මාධ්‍යකරණය යන පාඨමාලා සාර්ථකව අවසන් කරන ලද විද්‍යාර්ථීන්ට සහ 2023 වර්ෂයේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා චිත්‍ර, නැටුම් හා කෙටි නාට්‍යය දකුණු පළාත් හා ජාතික වටයෙන් ජයග්‍රහණ හිමිකරගත් විද්‍යාර්ථීන් සඳහා සහතික පත්‍ර ප්‍රධානෝත්සවය රුහුණු විශ්වවිද්‍යාලයීය උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන සහ නියෝජ්‍ය උපකුලපති, මහාචාර්ය සමන් චන්දන යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් 2024 අගෝස්තු 07 වන දින සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක, ආචාර්ය සුරංජිත් ගුණසේකර මහතාගේ මග පෙන්වීම යටතේ උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි.












## ජයග්‍රහණ ලැබූ විද්‍යාර්ථීන් ඇගයීම













2024-අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා සංගීත, නර්තන හා චිත්‍ර තරග සඳහා රුහුණ විශවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ පාඨමාලාවන් හදාරන විද්‍යාර්ථීන් ඉදිරිපත් වූ අතර දකුණු පළාත් තරග වටයේ නව නිර්මාණ/සමූහ/මිශ්‍ර / විවෘත යන නර්තන තරග ශීර්ෂය යටතේ ප්‍රථමස්ථානය දිනා ගන්නා ලදී. එමෙන්ම, "හෙට දවස" තේමා කරගනිමින් නව නිර්මාණ/වාදන/සංගීත යන තරග ශීර්ෂය යටතේ ප්‍රථමස්ථානයත්, චිත්‍ර තරගයේ විවෘත අංශයෙන් ප්‍රථම හා දෙවන ස්ථානයත් ලබා ගැනීමට සමත් වූහ.

සමස්ත ලංකා තරග නියෝජනය කළ නව නිර්මාණ/සමූහ/මිශ්‍ර/විවෘත යන ශීර්ෂය යටතේ නර්තන තරග ඉසව්වෙන් ජාතික වටයේ ප්‍රථමස්ථානයත් "හෙට දවස" තේමාකරගත් විවෘත/සමූහ/මිශ්‍ර/සංගීත තරග ඉසව්වෙන් තෙවන ස්ථානයත් හිමි කරගැනීමට සමත් වූහ.

මෙසේ ජයග්‍රහණය ලැබූ විද්‍යාර්ථීන් ඇගයීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 16 වන දින ප.ව. 4.00ට මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේදී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති, ප්‍රියන්ත රේණුක මහතාගේ හා සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක, ආචාර්ය සුරන්ජිත් ගුණසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් ඇගයුම් උළෙලක් සංවිධානය කරන ලදී.

මෙම සියලු කටයුතු වෙනුවෙන් සහය දැක්වූ රුහුණ විශ්වවිද්‍යාලයීය උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාට, සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක, ආචාර්ය සුරන්ජිත් ගුණසේකර මහතාට මෙන්ම සියළු කටයුතු වෙනුවෙන් කැප වූ නර්තනය පාඨමාලාවේ සම්පත්දායක දිනුක සදරුවන් මහතාට, චිත්‍ර හා මූර්ති පාඨමාලාවේ සම්පත්දායක, වජිර ඉන්දික බොරලැස්ස මහතාට, සංගීතය පාඨමාලාවේ සම්පත්දායක ප්‍රවීන් අමරතුංග මහතාට, සංස්කෘතික කේන්ද්‍රයේ ස්ථානභාර නිලධාරිනී, නිලන්ති රේණුකා මහත්මිය ඇතුළු සංස්කෘතික කේන්ද්‍රයේ කාර්යය මණ්ඩලයට හා විද්‍යාර්ථීන් සියළු දෙනාට එම ජයග්‍රහණයන්හි ගෞරවය හිමි වේ.



## ජයග්‍රහණ ලැබූ විද්‍යාර්ථීන් ඇගයීමේ උත්සවයේ මතක සටහන් කිහිපයක්







## අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි නාට්‍ය තරගාවලිය 2023

2023 වර්ෂයේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි නාට්‍ය තරගාවලියේ ජාතික වටය සඳහා ඉදිරිපත් වූ රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ නාට්‍ය හා රංග කලාව හදාරන විද්‍යාර්ථීන්, 2023 ජනවාරි 23 වන දින එල්පින්ස්ටන් රංග ශාලාවේ දී පැවති සම්මාන හා සහතික ප්‍රදානෝත්සවය සඳහා සහභාගී වූ අතර “රාමුව” කෙටි නාට්‍යය සඳහා කුසලතා සම්මාන මෙන්ම සහතික හා මුදල් ත්‍යාග තුනක් ද, “සෙවණැලි” නාට්‍යයේ හොඳම සහාය නිලිය, හොඳම රංග වින්‍යාසය හා හොඳම අධ්‍යක්ෂණයට සම්මාන සහතික සහ මුදල් ත්‍යාගයන් ද, ජාතික වටයේ හොඳම නාට්‍ය පහ අතරින් “සෙවනැලි” නාට්‍ය තෙවන ස්ථානයද හිමිකර ගනිමින් විශිෂ්ට ජයග්‍රහණයන් අත්පත් කරගන්නා ලදී. මේ සඳහා විශ්වවිද්‍යාලයීය උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන, නියෝජ්‍ය උපකුලපති, මහාචාර්ය සමන් චන්දන සහ සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක, ආචාර්ය සුරන්ජිත් ගුණසේකර යන මහත්වරුන් විසින් උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දුන් අතර මේ සඳහා ඉතා වෙහෙස වී පුහුණුවීම් කටයුතු සිදු කළ විද්‍යාර්ථීන් දිරි ගන්වමින් පුහුණුවීම් සිදු කළ නාට්‍ය හා රංග කලා පාඨමාලාවේ සම්පත් දායකත්වය ලබා දුන් නාට්‍ය ශිල්පී තාරක පුෂ්පකුමාර මහතා හට විශේෂ ගෞරවය හිමි වේ, සංස්කෘතික කේන්ද්‍රය නියෝජනය කරමින් නාට්‍ය සඳහා ඉදිරිපත් වූ විද්‍යාර්ථීන් හට මෙම ජයග්‍රහණය ඉතා ගෞරවණීය වනු ඇත.

## 2023 අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි නාට්‍ය තරගාවලියෙන් ජයග්‍රහණ ලැබූ නාට්‍යය කණ්ඩායමේ මතක සේයා රූ









## ප්‍රතිභා අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය 2024





බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් 2024 සැප්තැම්බර් 29 වන දින පවත්වන ලද 2024 ප්‍රතිභා අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරගාවලියේ දකුණු පලාත් වටය නියෝජනය කරමින් රුහුණු විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ නර්ථන පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සහභාගී වූ අතර දේශීය විදේශීය සාම්ප්‍රදායික නර්තන ඇසුරින් සමූහ/මිශ්‍ර/නිර්මාණාත්මක, නර්තන අංශය යටතේ ප්‍රථමස්ථානය දිනාගත් අතර “හෙට දවස” යන තේමාව මුල්කොට ගත් සමූහ/වාදන තරග අංශය යටතේ ප්‍රථමස්ථානය ද හිමි කර ගැනීමට සංගීත පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් පිරිස සමත් විය.


මෙම තරග අංශ සඳහා මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, කළමණාකරණ හා මූල්‍ය පීඨය, විද්‍යා පීඨය හා ධීවර හා සාගර විද්‍යා පීඨය යන පීඨවල, සංස්කෘතික කේන්ද්‍රයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් සහභාගී වූහ. නර්තන පාඨමාලාවේ සම්පත්දායක දිනුක සඳරුවන් මහතා සහ සංගීතය පාඨමාලාවේ සම්පත්දායක ප්‍රවීන් අමරතුංග විද්‍යාර්ථයා ඇතුලු සංස්කෘතික මධ්‍යස්ථානයේ නිළධාරීන්ගේ කැපවීම මෙම ජයග්‍රහණයට මුලික විය.

## අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන - ප්‍රතිභා චිත්‍ර තරගාවලිය

2024 වර්ෂයේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා චිත්‍ර තරගාවලියේ දකුණු පලාත් වටය නියෝජනය කරමින් රුහුණ විශ්වවිද්‍යාලීය සංස්කෘතික කේන්ද්‍රයේ චිත්‍ර හා මූර්ති පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සහභාගී වු අතර, ඉන් ප්‍රථම ස්ථානයත්, තුන්වන ස්ථානයත් සහ කුසලතා ස්ථාන තුනකුත් හිමි කර ගැනීමට එම විද්‍යාර්ථීන් සමත් වූහ. මේ සඳහා වජිර ඉන්දික බොරලැස්ස ගුරුතුමන්ගේ සම්පත්දායකත්වය සහ මග පෙන්වීම එම විද්‍යාර්ථීන්ට මනා පිටුවහලක් විය.









# 2025 සඳහා යෝජිත ක්‍රියාකාරකම් - සංස්කෘතික කේන්ද්‍රය

2025 වර්ෂය **සඳහා සංස්කෘතික කේන්ද්‍රය මගින් සංවිධානය කිරීමට අපේක්ෂා කරනු ලබන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් අතරින් කිහිපයක් පහත සඳහන් වේ.**

- **නේත්‍රාභිෂේක**

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රයට අනුබද්ධව නර්තන පාඨමාලාවන් හදාරන විද්‍යාර්ථීන්ට වෙස් සහ පායිම්පත් පැළැඳවීමේ උත්සවයක් සංවිධානය කිරීමට සැලසුම් කර ඇත.

- **සාර අර්ධ වාර්ෂික ශාස්ත්‍රීය විද්‍යුත් සඟරාවක් එළි දැක්වීම**

විශ්වවිද්‍යාල ප්‍රජාවට සහ ඉන් පරිබාහිරව, සංස්කෘතිය, කලාව, දේශපාලනය සහ සමාජ පර්යේෂණ යන ක්ෂේත්‍රයන්හි උනන්දුවක් දක්වන අයට මෙම සඟරාව සඳහා සිය ශාස්ත්‍රීය වියමන් ඉදිරිපත් කිරීමට ආරාධනා කර ඇත.

- **'අලුත් උදෑසනක්' තෙවන අදියර** - The third phase of 'A New Dawn'

'අලුත් උදෑසනක්' අදියර තුන (විවිධත්වය සැමරීම, එක්සත්බාවය වැළඳගැනීම) රුහුණ විශ්වවිද්‍යාල ඉතිහාසයේ පළමු වතාවට විද්‍යාර්ථීන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රජාවගේ සෞන්දර්යාත්මක කුසලතා එළිදක්වන අයුරින් ප්‍රධාන අංශ 12 ක් සහ ඊට සමාන්තර උප අංශ 46 ක් යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මධ්‍යයන් යටතේ මෙම තරගාවලිය පැවැත්වීමට සැලසුම් කර ඇත.

- **මහේන්ද්‍ර පෙරේරා ප්‍රත්‍යවලෝකනය** - 2025

සමකාලීන සිංහල සිනමාවේ ප්‍රශස්ත රංගධරයෙකු වන ජ්‍යෝෂ්ඨ සිනමානළු මහේන්ද්‍ර පෙරේරා සිංහල සිනමාව, වේදිකා නාට්‍යය, ටෙලිසිනමාව හා ටෙලි නාට්‍යය ක්ෂේත්‍රයන්හි දක්වන ලද රංග ප්‍රතිභාව වෙනුවෙන් ප්‍රත්‍යවලෝකනයක් සිදු කිරීමට සැලසුම්කර ඇත. මෙයට සමගාමීව "මහේන්ද්‍ර පෙරේරා ප්‍රත්‍යවලෝකනය" මැයෙන් උපහාර ග්‍රන්ථයක් රුහුණ විශ්වවිද්‍යාලීය සංස්කෘතික කේන්ද්‍රය මගින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

- **කලා සංගමය පිහිටුවීම**

රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයෙහි ලියාපදිංචි විද්‍යාර්ථීන්ගේ මූලිකත්වයෙන් සියලුම පීඨ නියෝජනය වන පරිදි කලා සංගමය පිහිටවීමට සැලසුම් කර ඇත.